**දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු (..........................)**
**කර්මාන්තමය සුරක්ෂිතතා අංශය**
**කම්කරු දෙපාර්තමේන්තුව**

**වර්ෂ 1942 ට පසුව කරන ලද සංශෝධන වලින් සංශෝධිත වර්ෂ 1942**
**අංක 45 දරන කර්මාන්තශාලා ආඥාපනත අනුව පිඹුරුපත්**
**අනුමැතිය සඳහා අයදුම් කිරීම**

මෙහි පහත අත්සන් කරන ..................................................................... ............................................................................................................ පාරේ අංක ............................................................................................................දරණ ස්ථානයේ පදිංචි.........................................................................................වන මම පූර්වොක්ත ආඥා පනතේ විධිවිධානයන්ට..................................................................................... අනුව............................................................................................................................. යන ස්ථානයේ ගොඩනැගීමට යෝජිත කර්මාන්තශාලාව සඳහා මෙම අයදුම් පතට අදාලව පිඹුරුපත් තුනක් සහ අනෙකුත් අදාල ලේඛන මේ සමඟ ඉදිරිපත් කරමි. මා මෙහි ඉදිරිපත් කර තිබෙන කරුණු සත්‍ය හා නිවැරදි තොරතුරු බවත් සඳහන් කරමි.

..........................................                                        .....................................
අයිතිකරුගේ/පදිංචිකරුගේ අත්සන                                        දිනය
මුද්‍රාව

**වර්ෂ 1942 ට පසුව කරන ලද සංශෝධන වලින් සංශෝධිත වර්ෂ 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥාපනත අනුව පිඹුරුපත් අනුමැතිය සඳහා අයදුම් කිරීම**

1. කර්මාන්තශාලාවේ නම -

2. අයිතිකරුගේ /පදිංචිකරුගේ නම -

ලිපිනය -

දුරකථන අංකය -

3. කර්මාන්තශාලාව පිහිටුවනු ලබන ස්ථානයේ ලිපිනය -

(පිහිටීම සම්බන්ධව සිතියමක් සහ මාර්ග සලකුණු සහිතව යෝජිත ස්ථානයට පැමිණිය හැකි මාර්ග සටහන් කර අමුණන්න.)

4. කර්මාන්තශාලාවේ යෙදවීම බලාපොරොත්තු වන මුළු සේවක සංඛ්‍යාව පිරිමි -

ගැහැණු -

5. එක් සේවා මුරයකදී කර්මාන්තශාලා පරිශ්‍රයේ අපේක්ෂිත මුළු සේවක සංඛ්‍යාව පිරිමි -

ගැහැණු -

6. යෝජිත කර්මාන්තශාලා ගොඩනැගිල්ලේ සම්පූර්ණ වර්ගඵලය - වර්ග අඩි/වර්ග මීටර්

7. කර්මාන්තශාලාවේ නිෂ්පාදන ස්වභාවය -

8. කර්මාන්තශාලාව දැනට දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලයේ ලියාපදිංචි වී ඇත්නම් එහි අංකය -

9. යෝජිත කර්මාන්තශාලාව නව කර්මාන්තශාලාවක්ද ? දැනට තිබෙන කර්මාන්තශාලාවක වැඩිදියුණු කිරීමක්ද යන වග -

10. කර්මාන්තශාලාව තුල වාතාශ්‍රය ස්වභාවිකද/කෘතිමද/යන වග -

11. පුද්ගලයින් සේවයේ යෙදවීමට අපේක්ෂිත කාමර

| (A) වැඩකරන කාමර අංකය | (B) දිග (අඩි) L | (C) පළල (අඩි) W | (D) උස (අඩි) H | (E) $V_1=(L \times W \times H)$ ඝන අඩි | (F) යන්ත්‍ර සඳහා වෙන් වන ඉඩ ප්‍රමාණය $V_2$ ඝන අඩි | (G) $V=\frac{V_1-V_2}{400}$ | (H) කාමරය තුල යෙදවීමට අපේක්ෂිත මුළු සේවකයින් ගණන | (I) කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | නිර්දේශය |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

**Table - 1**

(ගණනය සඳහා සලකනු ලබන්නේ අඩි 14 ක උසක් පමණයි.)      ඉඩකඩ ප්‍රමාණවත් නොවේ නම් වෙනමම ඇමුණුමක් ඉදිරිපත් කරන්න

12. සවි කිරීමට අපේක්ෂිත යන්ත්‍ර පිළිබඳ විස්තර

| **කාමර අංකය** | **අවශ්‍ය විදුලි බලය (එකලා / තෙකලා)** | **සවි කිරීමට අපේක්ෂිත යන්ත්‍ර** | **යනත්‍ර ගණන** | **වෙනත්** |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

**Table - 2**

(ඉඩකඩ ප්‍රමාණවත් නොවේ නම් වෙනමම ඇමුණුමක් ඉදිරිපත් කරන්න)

**13.** වාතාශ්‍රය

| කාමර අංකය | යෝජිත භාවිතය | **(A1)** ඇතුලත බිම වර්ගඵලය (දිග **x** පළල) වර්ග අඩි | **(A2)** පිටතට විවෘතවන දොරවල් සහ ජනෙල් වල වර්ගඵලය (උස **x** පළල) වර්ග අඩි | **A2/A1** | දොරවල් සහ ජනෙල් වල | | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|---|---|---|---|
| | | | | | වැඩිම උස (අඩි) | අඩුම උස (අඩි) | නිර්දේශය |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

**Table - 3**

(ඉඩකඩ ප්‍රමාණවත් නොවේ නම් වෙනමම ඇමුණුමක් ඉදිරිපත් කරන්න)

14.ඉදිකිරීමට අපේක්ෂිත ගොඩනැගිල්ලේ මහල් ගණන  -

එක් එක් මහලේ හදිසි අවස්ථාවකදී පිටවීමට යොදා ඇති පිවිසුම් මාර්ග -

| මහල් | පිටවීමේ දොරටු ගණන | දොරවල් වල | |
|---|---|---|---|
| | | උස (අඩි) | පළල(අඩි) |
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |
| 4 | | | |
| 5 | | | |

Table-4

15. ගිනි හෝ හදිසි අවස්ථාවකදී පිටවීමට මාර්ග සැලසුමක් මඟින් ඉදිරිපත් කර තිබේද?

16. විදුලි පුවරු, භවිතා කිරීමට අපේක්ෂිත යන්ත්‍ර සූත්‍ර හා ඒවායේ ප්‍රමාණයන් සවිකිරීමට අපේක්ෂිත ස්ථානද සැලසුමක් මඟින් ඉදිරිපත් කර තිබේද?

17. අධි අන්තරාදායී උපකරණ සහ ඒවා ස්ථානගත කිරීමට බලාපොරොත්තු වන ස්ථාන සැලසුම් මඟින් සඳහන් කර තිබේද? (ජනක යන්ත්‍ර, රසායනික ප්‍රතික්‍රියාකාරක යන්ත්‍ර යනාදිය, ඔසවන යන්ත්‍ර, පීඩන භාජන)

18. නිෂ්පාදන ක්‍රියාවලිය කෙටියෙන් විස්තර කරන්න-

(අදාල ගැලීම් සටහන් අමුණන්න)

19. භාවිතා කිරීමට යෝජිත ප්‍රධාන අමුද්‍රව්‍ය -

20. භාවිතා කිරීමට යෝජිත රසායනික ද්‍රව්‍යයන්, ඉන්ධන, ගිනි ගන්නා හා පුපුරණ ද්‍රව්‍යයන් ගබඩා කරන හෝ භාවිතා කරන ස්ථාන වල දළ සටහනක් ඉදිරිපත් කරන්න.

21. නිෂ්පාදන ක්‍රියාවලියේදී පිටවිය හැකි සේවා පරිසරයට අහිතකරයැයි අනුමාන කරනු ලබන අතුරුඵල තිබේ නම් සඳහන් කරන්න.

**22.** **සනීපාරක්ෂක පහසුකම් -**

| | Number of commodes | Number of squatting pans | Number of urinals |
|---|---|---|---|
| පිරිමි | | | |
| ගැහැණු | | | |

**23.** **සේදීමේ පහසුකම් -**

| | Number of wash Basin | Number of showers | Number of taps |
|---|---|---|---|
| පිරිමි | | | |
| ගැහැණු | | | |

**24.** **කෑම කාමර**

සේවකයන්ගේ ප්‍රයෝජනය සඳහා කෑම කාමරයට වෙන් වන මුළු වර්ග ප්‍රමාණය (වර්ග අඩි) –

කෑම පිසින කාමර තිබේ නම් දුමාරය පිටවන ක්‍රමයක් තිබේද?

**25.** **සේවකයන්ගේ බඩුබාහිරාදිය තැබීම සඳහා ඉඩකඩ වෙන් කර ඇති ආකාරය -**

| | ලොකර්ස් ගණන |
|---|---|
| පිරිමි | |
| ගැහැණු | |

26. අනෙකුත් පහසුකම් -

ඇඳුම් මාරු කිරීමේ කාමර ප්‍රමාණවත්ව සපයා තිබේද?

විවේක කාමර ප්‍රමාණවත් පරිදි සපයා තිබේද?

යෝජිත ප්‍රථමාධාර පහසුකම් සඳහා කාමර වෙන් කර තිබේද?

27. කර්මාන්තශාලාව සඳහා ඉදිකිරීමට අපේක්ෂිත ගොඩනැගිල්ල දෙමහල් හෝ ඊට වැඩි නම් වරලත් ඉංජිනේරුවරයකු විසින් සහතික කරනු ලැබූ පිඹුරුපත් තුනකින් ඉදිරිපත් කල යුතුය. එසේ ඉදිරිපත් කර තිබේද?

28. අදාල දේපලෙහි අයිතිය තහවුරු කිරීම සඳහා වන ඔප්පුව හෝ බදු ගිවිසුමේ පිටපත අමුණන්න.

29. යෝජිත කර්මාන්තශාලාව ඉදිකිරීමට නියමිත ඉඩමේ අනුමත මිනින්දෝරු සැලැස්මේ පිටපතක් අමුණන්න.

28. වෙනත් අමතර තොරතුරු -

මෙම ඉල්ලුම් පත්‍රයට මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික වෙමි. සියළුම ඉදිකිරීම් අනුමත පිඹුරුපතට අනුව සිදුකරනු ලබන බවත් අනුමත සැලසුමෙන් බාහිර කිසිදු වෙනසක් නොකරනු ලබන බවත් කිසියම් හෝ වෙනසක් කරනු ලබන්නේ නම් ඊට පෙර ප්‍රධාන කර්මාන්තශාලා පරික්ෂක ඉංජිනේරුගේ/ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුගේ අදාල අනුමැතිය ලබා ගන්නා බවත් මෙහි සඳහන් ඕනෑම තොරතුරක් ව්‍යාජ හෝ අසත්‍ය බව සොයාගනු ලැබුවහොත් මාගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලබන බවත් අනුමැතිය ලබාදී ඇත්නම් අවලංගු කරන බවත් මා හොඳින් දන්නෙමි.

දිනය - .........................................

........................................

අයිතිකරුගේ/පදිංචිකරුගේ අත්සන
මුද්‍රාව

**කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා**

1942 හි අංක 45 දරණ කර්මාන්තශාලා අඥාපනත හා අදාල සංශෝධන පනත් වලින් සඳහන් අදාල **රෙගුලාසි සපුරා ඇති බැවින් අනුමත කරමි/පහතින් දක්වා ඇති කරුණු සපුරා නොමැති බැවින් අනුමත නොකරමි.**

දිනය - .........................................

...........................................

ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු/
දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු
මුද්‍රාව

පිඹුරුපත් අනුමැතිය ලබා නොදීමට අදාල කරුණු -

**වර්ෂ 1942 ට පසුව කරන ලද සංශෝධන වලින් සංශෝධිත වර්ෂ 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥාපනත අනුව පිඹුරුපත් අනුමැතිය සඳහා අයදුම් කිරීම**

**ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීමට කර්මාන්තශාලා වෙත දෙනු ලබන උපදෙස්**

කර්මාන්තශාලා ගොඩනැගිල්ලක් ඉදිකිරීම, කර්මාන්තශාලා ගොඩනැගිල්ලක යම් විශාල කිරීමක් හෝ වෙනත් යම් ගොඩනැගිල්ලක් කර්මාන්තශාලා ගොඩනැගිල්ලක් බවට පරිවර්තනය කිරීම කර්මාන්තශාලා ආඥා පණත යටතේ අනුමැතිය සඳහා පහත සඳහන් කොන්දේසි වලට අනුකූල විය යුතුය.

**1. සාමාන්‍ය**

1.1. භූමි සැලැස්ම ඇතුලු සියලුම සැලසුම් පිටපත් 3 කින් යුක්තව පරිමාණයට ඇඳ අවශ්‍ය මාන යොදා ඉදිරිපත් කල යුතුය (මෙහි අනුමත පිටපත් දෙකක් ඔබගේ ප්‍රයෝජනය සඳහා වේ.)

1.2. විවිධ නිෂ්පාදන අදියරයන්ගේ කෙටි විස්තරයක් සහ එම නිෂ්පාදන ක්‍රියාවලියේ ගැලීම් සටහන් ඉදිරිපත් කල යුතුය.

1.3 අදාල දේපලෙහි අයිතිය තහවුරු කිරීම සඳහා වන ඔප්පුව හෝ බදු ගිවිසුමේ පිටපත ඉදිරිපත් කල යුතුය.

1.4 යෝජිත කර්මාන්තශාලාව ඉදිකිරීමට නියමිත ඉඩමේ අනුමත මිනින්දෝරු සැලැස්මේ පිටපතක් ඉදිරිපත් කල යුතුය.

**2. ඇතුල්වීමේ හා පිටවීමේ මාර්ග**

2.1 සෑම දොරක්ම පිටතට විවෘත විය යුතු අතර එසේ නැත්නම් ලිස්සුම් දොරක් විය යුතුය. පුද්ගලයන් සේවයේ යෙදී සිටින ප්‍රමාණය අනුව සෑම කාමරයක් සඳහාම අවම වශයෙන් දොරවල් දෙකක් තිබිය යුතුය.

2.2 තට්ටු ගොඩනැගිලිවල ඉහලමාල වල වැඩ කරන සේවකයන්ට හදිසි අවස්ථාවන්හිදී පිටවීම සඳහා හදිසි පිටවීමේ අමතර මාර්ගයක් තිබිය යුතුය.

2.3 සෑම වැඩ කරන ස්ථානයකටම ආරක්ෂා සහිත පිටවීමේ මාර්ගයක් තිබිය යුතුය.

2.4 සෑම තරප්පු පෙලක් සඳහා අවශ්‍ය පරිදි අත්වැටවල් සපයා තිබිය යුතුය.

**3. ඉඩ ප්‍රමාණය**

3.1 කර්මාන්තශාලාවේ සේවයෙහි යෙදවීමට බලාපොරොත්තු වන සම්පූර්ණ සේවක සංඛ්‍යාව ( ගැහැණු /පිරිමි ) සඳහන් කල යුතුය.

3.2 සෑම වැඩ කරන කාමරයකම යෙදවීමට බලාපොරොත්තු වන සේවක සංඛ්‍යාව ( පිරිමි / ගැහැණු ) සඳහන් කල යුතුය.

3.3 සෑම වැඩ කරන කාමරයකම එක් පුද්ගලයෙකු සඳහා අවම වශයෙන් ඝන අඩි 400 ක නිදහස් ඉඩ ප්‍රමාණයක් තිබිය යුතුය. මෙම ගණන් බැලීමේදී බිමෙහි සිට අඩි 14 කට වඩා ඉහල ඇති ඉඩ නොසැලකේ.

**4. භූමිගත කාමර**

දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු හෝ ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු විසින් සුදුසු යැයි සහතික කලහොත් මිස ගබඩා කිරීමට හැර වෙනයම් කාර්යයන් සඳහා පාවිච්චි නොකල යුතුය.

**5. වාතාශ්‍රය**

5.1 සෑම වැඩකරන කාමරයක් සඳහාම ප්‍රමාණවත් වාතාශ්‍රය සැපයිය යුතුය. තවද කර්මාන්තශාලාවේ සෑම කාමරයකම පිටතට විවෘතවන දොරවල් හා ජනෙල් වල වර්ග ප්‍රමාණය, කාමරයේ ඇතුලත බිමෙහි වර්ග ප්‍රමාණය සහ යෝජිත භාවිතය යන කරුණු ඉදිරිපත් කල යුතුයි.

5.2 යම් ක්‍රියාවලියකදී දූවිලි දුම් හෝ අමතර රත් වූ වායු හෝ වාෂ්ප ඇති වන්නේ නම් ඒවා ඉවත් කිරීමට හෝ ඒවා අන්තරාකාරී නොවන තත්වයට පත් කිරීමට ගන්නා ක්‍රියා මාර්ග සැලසුම් වල පෙන්විය යුතුය (වාතය පිටකිරීමේ මාර්ග යනාදිය).

**6. නිරාවරණය වීම**

6.1 යම්කිසි කර්මාන්තශාලාවක සිදු කෙරෙන ක්‍රියාවලියකදී විකිරණයන් කම්පනයන් සහ ශබ්දයන් ඇතිවේ නම් ඒවායින් සේවකයින්ට ඇතිවන බලපෑම අඩුවන සේ හෝ නැතුව යන සේ ගොඩනැගිලි නිර්මාණය කල යුතුය. එසේ නොමැති නම් එම ක්‍රියාවලින් සිදු කෙරෙන ස්ථානය සේවකයන් වැඩ කරන අනෙකුත් ස්ථානයන්ගෙන් වෙන්කොට සෑදිය යුතුය.

6.2. ශබ්දය සඳහා කර්මාන්තශාලා ආඥා පනතට අදාල රෙගුලාසි අනුගමනය කරන්න.

6.3. යම්කිසි ක්‍රියාවලියකදී හුස්ම ගැනීමට අපහසු කරවන හෝ පීඩාකාරී වායුවක් හෝ වාෂ්පයක් හෝ නිපදවීමට ඉඩකඩ ඇත්නම් එම ක්‍රියාවලිය සිදු කරන යන්ත්‍රාගාරය මිනිසුන් සාමාන්‍යයෙන් වැඩෙහි නොයොදවනු ලබන කර්මාන්තශාලාවේ කොටසක පිහිටුවා තැබිය යුතුය.

**7. ආලෝකය**

7.1 කර්මාන්තශාලාවක මිනිසුන් වැඩ කරන සෑම කොටසකටම ප්‍රමාණවත් ආලෝකය ලබාදිය යුතුය. මේ සඳහා කර්මාන්තශාලා ආඥා පනත සහ එහි රෙගුලාසි අනුගමනය කරන්න.

7.2 වෙනස් වන බාහිර තත්ව අනුව ආලෝකය ලැබීමට ඉඩකඩ සැලසීම සඳහා සහ ඉන් ඇස්වලට පීඩාකාරී ප්‍රබල දීප්තිය නැති කිරීම පිණිස එහා මෙහා කල හැකි සුදුසු උපක්‍රම ජනේල වලට යෙදිය යුතුය.

7.3 සේවකයින් වැඩෙහි යෙදෙන කාමර වල ස්වාභාවික ආලෝකය ලැබීම සඳහා වන මාර්ග(දොර ජනේල යනාදිය) අවම වශයෙන් බිමෙහි මුළු බිම් ප්‍රමාණයෙන් 10% ක් විය යුතුය.

**8. බිමෙහි කාණු ක්‍රමය**

කාණු ක්‍රමයකින් ඉවත් කිරීමට හැකි වන තරමට යම් බිමක් තෙත් කරන සුලු යම් නිපදවීමේ ක්‍රමයක් පවත්වාගෙන යන අවස්ථාවේදී ඉවත් කිරීම සඳහා සුදුසු ක්‍රමයක් යෙදිය යුතුය.

**9. විදුලි පරිපථ සහ උපකරණ**

9.1. භාවිතා කරන සෑම විදුලි උපකරණයක්ම අංගෝපාංගයක්ම සහ සන්නායකයක්ම එහි සඳහන් කර ඇති කාර්ය සඳහා ධාරාව අනුව ප්‍රමාණවත් විය හැකි ප්‍රමාණයෙන් යුක්ත විය යුතුය.

9.2. විදුලි පද්ධතියේ සැලැස්මක් ඉදිරිපත් කල යුතු අතර එහි විදුලි පද්ධතියේ ඇති ස්විච් සහ අනෙකුත් උපාංගවල තොරතුරු, විදුලි රැහැන් වල තොරතුරු ඇතුලත් විය යුතුය. (Line load diagram)

9.3 විදුලි පුවරු සහ ස්විචයන් සවිකිරීමේදී සේවකයන්ට පහසුවෙන් ළඟා විය හැකි පරිදි ස්ථානගත කල යුතුයි.

**10. සුභසාධනය**

මේ සඳහා කර්මාන්තශාලා ආඥා පනත හා ඊට අදාල රෙගුලාසි අනුගමනය කරන්න.

**10.1. කෑම කන කාමර**

(අ) කර්මාන්තශාලාවේ සේවකයින්ට ආහාර ගැනීම සඳහා වෙනමම කාමර සැපයිය යුතු අතර ඒවායේ එක වර මුළු සේවක සංඛ්‍යාවෙන් 30% කට පාවිච්චි කල හැකි සේ පහසුකම් සැලසිය යුතුය. එහිදී එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් වර්ග අඩි 10ක ඉඩ ප්‍රමාණයක් තිබිය යුතුය.

(ආ) කෑම කන කාමර සේවකයන්ට පහසුවෙන් ලඟාවිය හැකි ස්ථානයක සෑදිය යුතුය.

(ඇ) අත් සේදීමේ පහසුකම් හා බීමට ජලය සැපයිය යුතුය.

(ඈ) කෑම කාමර වලට ප්‍රමාණවත් අන්දමින් ආලෝකය හා වාතය සැකසෙන සේ ඒවා නිර්මාණය කල යුතුය.

(ඉ) අනවශ්‍ය වතුර බැස යාමට කාණු සකස් කල යුතුය.

(ඊ) යම් ගොඩනැගිල්ලක දූවිල්ලක් හෝ දුමක් පැනනැගෙන පරිදි ඊයම්, ආසනික් හෝ වෙනත් විෂ ද්‍රව්‍යයන් පාවිච්චි කරන්නේ නම් එහි සේවකයන්ට කෑම ගැනීම සඳහා වෙනත් ගොඩනැගිල්ලක පහසුකම් සැපයිය යුතුය.

(උ) කෑම පිළියෙල කරන කාමර වල දුම් පැන නැගීමට ඇති අවස්ථා වලදී ඒ සඳහා දුම් ඉවත් කිරීමේ ක්‍රම සැපයිය යුතුය.

(ඌ) මේ සඳහා කර්මාන්තශාලා ආඥා පනත හා ඊට අදාල රෙගුලාසි අනුගමනය කරන්න.

## 10.2. වැසිකිලි හා කැසිකිලි පහසුකම්

(අ) සෑම ස්ත්‍රීන් 25 කටම අඩු ගණනේ එක් සුදුසු වැසිකිලියක්ද සෑම පිරිමින් 25 කටම එක් සුදුසු වැසිකිලියක්ද සැපයිය යුතුය.

(ආ) පිරිමි සේවකයින්ගේ සංඛ්‍යාව 100කට වැඩි වන විට ප්‍රමාණවත් කැසිකිලි පහසුකම් සපයා ඇති විට 100 කට වැඩි වන සෑම 40 කටම එක් වැසිකිලියක් බැගින් සැපයිය යුතුය.

(ඇ) පිරිමි සේවකයන් සංඛ්‍යාව 500 කට වැඩි වන විට හා ප්‍රමාණවත් කැසිකිලි පහසුකම් සපයා ඇති විට 500 කට වැඩි වන සෑම 60 කටම එක් වැසිකිලියක් බැගින් ප්‍රමාණවත්ය.

(ඈ) වැසිකිලි සහ කැසිකිලි පහසුකම් කෑම ද්‍රව්‍ය පිළියෙල කරන කාමරයට කෙලින්ම සම්බන්ධ නොවිය යුතුය.

(ඉ) වැසිකිලි හා කැසිකිලි සේවකයන්ට පහසුවෙන් ලඟා විය හැකි පරිදි ස්ථානගත කල යුතු අතර පුද්ගලිකත්වය ආරක්ෂා වන සේ පිළියෙල කල යතුය.

(ඊ) පිරිමි කම්කරුවන් සඳහා සෑම 50 දෙනෙකුටම එක බැගින් කැසිකිලි පහසුකම් සැපයිය යුතුය. එසේ වුවද සංඛ්‍යාව 500කට වැඩිවෙන සෑම 100කට එක් කැසිකිලියක් බැගින් සැපයීම ප්‍රමාණවත්ය.

(උ) මේ සඳහා කර්මාන්තශාලා ආඥා පනත හා ඊට අදාල රෙගුලාසි අනුගමනය කරන්න.

## 10.3 සේදීමේ පහසුකම්

මේ සඳහා කර්මාන්තශාලා ආඥා පනත හා ඊට අදාල රෙගුලාසි අනුගමනය කරන්න.

## 10.4 බඩුබාහිරාදිය තබා ගැනීමේ ඉඩ කඩ

සේවකයන්ගේ බඩුබාහිරාදිය හා වැඩ කරන අවස්ථාවන් හිදී පාවිච්චි නොකරන ඇඳුම් තබා ගැනීම සඳහා සුදුසු ඉඩ කඩ සැපයිය යුතු අතර ඒවා පිරිමින්ට හා ස්ත්‍රීන්ට වෙන් වෙන්ව සැපයිය යුතුය.

## 10.5 විවේක කාමර

ස්ත්‍රීන් රාත්‍රී සේවයේ යෙදවීමට බලාපොරොත්තු වන අවස්ථා වලදී විවෙක ගැනීම සඳහා විවේක කාමර සැපයිය යුතුය.

## 10.6 ප්‍රථමාධාර

(අ) මේ සඳහා කර්මාන්තශාලා ආඥා පනත හා ඊට අදාල ප්‍රථමාධාර සඳහා නිකුත් කර ඇති රෙගුලාසි අනුගමනය කරන්න.

(ආ) ප්‍රථමාධාර කාමරයක් සපයන අවස්ථා වලදී එය සැලසුම් වල දැක්විය යුතුය.

**වෙනත්**

11. කර්මාන්තශාලාවේ ඉදිකිරීම් අතරතුර අදාල ඉදිකිරීම් කර්මාන්තශාලා ආඥාපනතේ විධිවිධාන වලට යටත්ව කරනු ලබන්නේ දැයි දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුගේ අධීක්ෂණයට ලක්කිරීම මගින් අවශ්‍ය වැඩිදුර උපදෙස් ලබා ගත හැක. තවද මෙහිදීද ඉදිකිරීම් සුරක්ෂිතතාවය ආඥා පනතට අනුකූලව කල යුතුය.

12. කර්මාන්තශාලාවේ ඉදිකිරීම් කටයුතු නිමා කිරීමෙන් පසු සේවකයන් සේවයේ යෙදවීමට පෙර අදාල ඉදිකිරීම් කටයුතු අනුමත ගොඩනැගීලි පිඹුරුපත් අනුව කර්මාන්තශාලා ආඥාපනතේ විධි ධාන වලට යටත්ව නිමකල බවට දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුගේ අදාල අනුමැතිය ලබාගත යුතුය.